
කෘතවේදී

# ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය

Kṛitavedi

Festschrift for Senior Professor Piyadasa Ranasinghe



# විමර්ශන මූලාශ්‍ර පිළිබඳ සංක්ෂිප්ත විවරණයක්

ජී. එම්. එස්. කේ. ගිරාකඩුව


## සාරාංශය

*තොරතුරු මත පදනම් වූ අද සමාජය පුස්තකාලය හෝ විඥාපන මධ්‍යස්ථානය කරා සමීප වන්නේ තමන්ගේ තොරතුරු අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ය. එසේ පැමිණෙන්නා වූ උපයෝජකයින් හමුවේ පුස්තකාලයෙන් ඉටුවිය යුතු සේවාවන් නිසි පරිදි ඉටුවීම අනිවාර්යය කාර්යයකි. එකී පුස්තකාල සේවාවන් අතර විමර්ශන සේවයට ලැබෙනුයේ ප්‍රමුඛස්ථානයකි. එසේ ම තොරතුරු සොයා එන උපයෝජකයින්ට විමර්ශන සේවයෙන් සිදුවන්නේ ඉමහත් සේවයකි. අන්තර්ගතය, තොරතුරු වින්‍යාසය, යාවත්කාලීන බව හා සාධිකාරිත්වය යන කරුණුවලින් විමර්ශන ග්‍රන්ථ අනෙකුත් සාමාන්‍ය තොරතුරු මූලාශ්‍රයන්ට වඩා සුවිශේෂිත්වයක් උසුලනු ලැබේ. පාඨකයින් විසින් විමසනු ලබන ඕනෑම සරල හෝ සංකීර්ණ එසේත් නොමැති නම් ක්ෂණික හෝ පර්යේෂණාත්මක, ජාතික හෝ අන්තර්ජාතික හෝ ඕනෑම ගැටලුවකට පිළිතුරු දීමේ හැකියාව විමර්ශන මූලාශ්‍රවලට තිබේ. විමර්ශන කෘති වර්ග මොනවාද යන්නත්, ප්‍රධාන විමර්ශන මූලාශ්‍ර මොනවා ද යන්නත්, එහි ඇති වැදගත්කම පිළිබඳවත් මෙහි දී අවධානය යොමු කර ඇරේ.*



ප්‍රමුඛපද : *විමර්ශන මූලාශ්‍ර, විමර්ශන සේවා, තොරතුරු සේවා, තොරතුරු මූලාශ්‍ර, ග්‍රන්ථවිද්‍යාත්මක මූලාශ්‍ර.*


## හැඳින්වීම

මානව ශිෂ්ටාචාරය ආරම්භයේ සිට ම මූලික මිනිස් අවශ්‍යතාව ලෙස සලකන ලද්දේ වාතය, ජලය, ආහාර හා නිවාස ය. වර්තමානය වන විට මෙයට එකතු වී ඇති පස්වන මිනිස් අවශ්‍යතාව වී ඇත්තේ තොරතුරු (Information) ය. මේ වන විට තොරතුරු ජාතික හා ජාත්‍යන්තර සම්පතක් බවට පත් වී අවසාන ය. අද විවිධ මිනිස් අයිතිවාසිකම් හේතු කොට ගෙන තොරතුරු බිහිවීමේ වේගය දෙගුණ තෙගුණ වෙමින් පවතියි. මෙලෙස වෙනස් වන තොරතුරු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ලෝකයේ සෑම රජයක ම සාදාචාරාත්මක වගකීමක් බවට පත්ව ඇති අතර එවන් තොරතුරු වෙත නිදහසේ පිය නැගීමත් තොරතුරු දැනගැනීමත් පොදුජන අයිතියක් බවට පත්ව ඇත. මෙලෙස වෙනස් වන තොරතුරු ජනතාව වෙත ගෙනයාමේ උත්කෘෂ්ඨ වගකීම පැවරී ඇත්තේ පුවත්පත්, රූපවාහිනී, ගුවන් විදුලි වැනි විවිධ සන්නිවේදන මාධ්‍යයන්ට ය. නමුත් ප්‍රධාන ගැටලුව වී ඇත්තේ ජනතාවට අවශ්‍ය තොරතුරු අවශ්‍ය වේලාවට අවශ්‍ය පරිදි ලබා දීමට මෙම සන්නිවේදන මාධ්‍ය පොහොසත් වනවාද යන්න ය. එබැවින් මෙම කාර්යය නිතැතින්ම පැවරී ඇති ආයතන විශේෂයක් ලෙසින් පුස්තකාල හා විඥාපන මධ්‍යස්ථාන ද හඳුන්වා දිය හැකි ය.

ඒ අනුව එකී වගකීම හා අරමුණු සපුරාලනු වස් පුස්තකාල හා විඥාපන මධ්‍යස්ථාන පාඨක සේවාවන් පවත්වා ගෙන යනු ලබයි. මෙලෙස පවත්වා ගෙන යනු ලබන සේවාවන්ගේ හදවත ලෙස හඳුන්වනු ලබන්නේ විමර්ශන සේවයයි. පුස්තකාලයෙහි හදවත බඳු විමර්ශන සේවාවෙහි ජීව රුධිරය නම් විමර්ශන මූලාශ්‍රයන් ය. පාඨකයින් නගනු ලබන්නා වූ විවිධාකාර වූ විමර්ශන ගැටලුවලට පිළිතුරු ලබා දීමේ අරමුණින් පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන විවිධ වූ විමර්ශන මූලාශ්‍රය ප්‍රතිග්‍රහණය කරයි. මේ සෑම විමර්ශන මූලාශ්‍රයකින් ම විවිධාකාර වූ තොරතුරු අවශ්‍යතාව සපුරා ලනු ලැබේ. කුමන තොරතුරු මූලාශ්‍ර පුස්තකාලයේ තිබුණ ද අනිවාර්යයෙන් ම ප්‍රතිග්‍රහණය කරගත යුතු වන්නේ ඉතාමත් සාධිකාරී තොරතුරු අන්තර්ගත මනා නිමාවකින් යුත් විමර්ශන මූලාශ්‍රය ය.

## විමර්ශන මූලාශ්‍ර හඳුනාගැනීම සහ සාහිත්‍ය විමර්ශනය

ලෝකයේ විවිධ රටවල විවිධ පුද්ගලයන් හා ප්‍රකාශ සමාගම් විසින් විවිධ වර්ගයේ තොරතුරු මූලාශ්‍ර දහස් ගණනින් බිහි කරනු ලැබේ. එහෙත් එලෙස යම් යම් දෑ බිහි වූ සැණින් ඒවා පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයන්ට මිල දී ගනු නොලැබෙන්නේ එහි ඇති සාධිකාරී භාවයෙහි අඩු ලුහුඬුකම් නිසා ය. පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන විමර්ශන මූලාශ්‍රය මිල දී ගනු ලබන්නේ කිසියම් නීත්‍යානුකූල ක්‍රමවේදයකට අනුව ය. විශේෂයෙන් ම විමර්ශන මූලාශ්‍රයක් මිල දී ගනු ලබන්නේ එම විමර්ශන මූලාශ්‍රය කිසියම් ඇගයීම් ක්‍රමවේදයකට ලක් කිරීමෙන් අනතුරුව ය. සරලව කිවහොත් මෙම ලක්ෂණ විමර්ශන මූලාශ්‍රයක අන්තර්ගත විය යුතු මූලික කරුණු ලෙස ද සඳහන් කළ හැකි ය. විමර්ශන මූලාශ්‍රය ඇගයීම පුස්තකාල විසින් අනිවාර්යයෙන් ම කළ යුතු ක්‍රියාවලියකි. විමර්ශන මූලාශ්‍රය ඇගයීමෙන් පාඨකයාට අවශ්‍ය විමර්ශන පොතපත මොනවාද, පාඨකයන් විසින් නගනු ලබන විවිධාකාර විමර්ශන ප්‍රශ්නවලට පුස්තකාල සතු විමර්ශන මූලාශ්‍රය පිළිතුරු ලබා දීමට සමත් වන්නේ ද යන කරුණුවලට පිළිතුරු ලබා ගත හැකි ය. විමර්ශන මූලාශ්‍ර ප්‍රධාන වශයෙන් ආකාර දෙකක් යටතේ හඳුනා ගත හැකි ය. එනම්,

1. මුද්‍රිත මූලාශ්‍ර
2. ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍ර

වශයෙනි. මෙලෙස මාධ්‍ය දෙකක් වශයෙන් පැවතියත් මෙම මූලාශ්‍ර විශේෂයන් දෙකින් ම සිදු වන්නේ එකම ක්‍රියාවලියකි. වෙනසක් වශයෙක් පවතිතොත් පවතින්නේ එහි ඇති මුද්‍රිත හා අමුද්‍රිත යන වෙනස පමණකි. විමර්ශන මූලාශ්‍රයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි විලියම් වර්නර් බිෂොප් මෙසේ නිර්වචනය කොට ඇත.

> "විමර්ශන මූලාශ්‍රයක් යනු පුස්තකාලයට පැමිණෙන පාඨකයන්ට අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු විධිමත්ව කරගෙන යාම සඳහා පුස්තකාලයාධිපති විසින් සපයා ඇති මූලාශ්‍රයන් ය. ඒ අනුව විමර්ශන මූලාශ්‍රයක් සෑම පාඨකයෙකුට ම පෞද්ගලිකව ම උපකාරී වන්නකි."

සෑම පුස්තකාලයක ම හෝ විඥාපන මධ්‍යස්ථානයක ම ශක්තිමත් බව රඳා පවතින්නේ එහි ඇති විමර්ශන ග්‍රන්ථ එකතුව මතය. විමර්ශන ග්‍රන්ථ හෙවත් මුද්‍රිත විමර්ශන මූලාශ්‍ර ලෙසින් අදහස් කරනු ලබන්නේ විවිධාකාර තොරතුරු නොපමාව ලබා ගත හැකි වන පරිදි ප්‍රමිති ගත අන්දමට අනුපිළිවෙළකට සංවිධානය කර ඇති ග්‍රන්ථ විශේෂයකට ය. සාමාන්‍ය ග්‍රන්ථයකට වඩා විමර්ශන ග්‍රන්ථයක් තරමක් වෙනස් ස්වරූපයක් ගනු ලබයි. එනම්,

- පොත මුල සිට අගට කියවීම අනවශ්‍ය ය.
- ක්ෂණිකව තොරතුරු උද්ධරණය කරගත හැකි වන පරිදි සැකසී ඇත.
- කෘතිවල අන්තර්ගත කරුණු නිරන්තරයෙන් යාවත්කාලීන වේ.
- සාමාන්‍ය ග්‍රන්ථවලට වඩා මිලෙන් අධික ය.
- පුස්තකාලයෙන් බැහැරට ගෙන යා නොහැකි ය.

රොබට් එම්. මර්ෆි (Robart M. Merfi) සඳහන් කරන ආකාරයට

> "විමර්ශන අරමුණු සඳහා පමණක් පුස්තකාලයෙහි තිබෙන ග්‍රන්ථ විශේෂය විමර්ශන මූලාශ්‍ර වන අතර යම් වින්දනයක් සඳහා එක දිගට ම නොකිය විය යුතු මේවායින් තමාට අවශ්‍ය තොරතුරු පමණක් පරිශීලනය කළ යුතු ය."

එමෙන් ම ALA Glossary (American Library Association) සඳහන් කරන ආකාරයට විමර්ශන මූලාශ්‍රයක් යනුවෙන් අදහස් කරන්නේ,

> "යම් වින්දනයක් උදෙසා එක දිගටම නොකියවිය යුතු සුවිශේෂී තොරතුරක් දැන ගැනීමට පමණක් භාවිත කළ යුතු ග්‍රන්ථ විශේෂයකි. කිසිදු හේතුවක් නිසා පුස්තකාලයෙන් බැහැරට ගෙන යාමට නොදෙන අතර පුස්තකාලය තුළදී පමණක් පරිශීලනය කළ යුතු ග්‍රන්ථයකි."

මෙකී නිර්වචනයන්ට අනුව සලකා බලන කල්හි විමර්ශන මූලාශ්‍රයක් යනු අතිශය වටිනා ග්‍රන්ථ විශේෂයක් ලෙස පෙන්වා දීමට පිළිවන.

## විමර්ශන මූලාශ්‍ර වර්ග

අනෙකුත් සෑම පුස්තකාල ද්‍රව්‍යයක් සේම විමර්ශන මූලාශ්‍ර ද විවිධාකාරයෙන් නිරූපිත ය. ඒ එහි ස්වභාවය හා අන්තර්ගත තොරතුරු පදනම් කරගෙන ය. අන්තර්ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා විශ්වකෝෂයෙහි "International Encyclopaedia of Information Technology and Library Science " දැක්වෙන පරිදි ප්‍රධාන විමර්ශන මූලාශ්‍ර වර්ග 12ක් පිළිබඳව අනාවරණය කරගත හැකි ය.

1. ග්‍රන්ථනාමාවලී (Bibliographies)
2. ශබ්දකෝෂ (Dictionaries)
3. විශ්වකෝෂ (Encyclopedias)
4. වාර්ෂික ග්‍රන්ථ (Yearbooks)
5. නියමාවලී (Manuals)
6. චරිතාපදානාත්මක මූලාශ්‍ර (Biographical Resources)
7. අනුක්‍රමණිකා (Indexes)
8. මාලික ප්‍රකාශන (Serial Publications)
9. අත්පොත් (Handbooks)
10. නාමාවලී (Directories)
11. භූගෝල විද්‍යාත්මක මූලාශ්‍ර (Geographical Resources)
12. රජයේ ප්‍රකාශන (Government Publications)

යන මූලාශ්‍ර දොළසයි. මෙයින් මුද්‍රිත විමර්ශන මූලාශ්‍ර හා ඉලෙක්ට්‍රෝනික විමර්ශන මූලාශ්‍ර අතර ප්‍රධාන වෙනස වන්නේ මුද්‍රිත මූලාශ්‍ර මුද්‍රණ ද්වාරයෙන් පිට වූ ඒවා වීමයි. ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍ර යම් ඉලෙක්ට්‍රෝනික උපකරණයක් ආධාරයෙන් මිස වෙනත් අයුරකින් ලබා ගත නොහැකි ය. කෙසේ නමුදු මෙම දෙකින්ම සිදු වන්නේ එකම සේවාවකි. එනම්, පාඨකයන්ගේ හෙවත් උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීම පිණිස උපකාරී වීමයි. මෙම මූලාශ්‍ර පිළිබඳ මෙහිදී දීර්ඝ වශයෙන් විමසා බැලීම වටී.

### 1. ග්‍රන්ථ නාමාවලී **(Bibliographies)**

International Encyclopaedia of Information Technology and Library Science කෘතිය දක්වන පරිදි ප්‍රධාන විමර්ශන මූලාශ්‍ර වර්ග 12 කි. එහි පළමු විමර්ශන මූලාශ්‍රය ලෙස දක්වා ඇත්තේ ග්‍රන්ථ නාමාවලී ය. එමගින් අපට පෙනී යන්නේ විමර්ශන ග්‍රන්ථ අතර ග්‍රන්ථ නාමාවලී සුවිශේෂී ස්ථානයක් හිමිකර ගන්නා බවයි. ග්‍රන්ථ නාමාවලියක් යනු පොත් පිළිබඳ ග්‍රන්ථ විස්තර ඇතුළත් වන ප්‍රකාශනයකි. රටක ප්‍රකාශයට පත් වන මෙන්ම ප්‍රකාශයට පත් වූ මුද්‍රිත ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ඇතුළත් ලැයිස්තුව ග්‍රන්ථ නාමාවලී ලෙස හැඳින්විය හැකි ය.

ග්‍රන්ථ නාමාවලීකරණයේ දී විවිධ වූ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ග්‍රන්ථ නාමාවලී සම්පාදනය කරනු ලබයි. ඒවා අතර ජාතික ග්‍රන්ථ නාමාවලී (ප්‍රවර්තන, පූර්වකාලීන), විෂය ග්‍රන්ථ නාමාවලී, ළමා ග්‍රන්ථ නාමාවලී ආදිය නිදසුන් ලෙස දැක්විය හැකිය.

ඉහත සඳහන් කළ ග්‍රන්ථ නාමාවලී අතර, ජාතික ග්‍රන්ථ නාමාවලීන්ට (ප්‍රවර්තන) හිමි වන්නේ ප්‍රධාන ස්ථානයකි. කිසියම් රටක ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රකාශන පිළිගත් ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රමිති අනුව වර්ග කර, සුවිගත කර සම්පාදනය කරන සාධිකාරී ලේඛන ජාතික ග්‍රන්ථ නාමාවලී ලෙස හැඳින්වේ. මෙය කිසියම් නිශ්චිත කාල සීමාවකට අදාළව නිකුත් කරනු ලබයි. මෙයට ඇතුළත් කරනු ලබන්නේ කාලීනව ප්‍රකාශයට පත් කරන ලද පොත්පත්ය. අද වන විට ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්කරන ලද තොරතුරු මූලාශ්‍රය ඇතුළත් වන පරිදි ග්‍රන්ථ නාමාවලී ප්‍රතිපත්ති සංශෝධනය කර ඇත. කාලානුක්‍රමිකව ප්‍රකාශයට පත්වන බැවින් මෙය ප්‍රවර්තන ග්‍රන්ථ නාමාවලියක් වෙයි.

- බ්‍රිතාන්‍ය ජාතික ග්‍රන්ථ නාමාවලිය
- ඕස්ට්‍රේලියානු ජාතික ග්‍රන්ථ නාමාවලිය
- ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

ආදිය ප්‍රධාන ජාතික ග්‍රන්ථ නාමාවලීන්ට උදාහරණ ලෙස දැක්විය හැකිය. පුස්තකාලයවලට පොත් තේරීමේදී, දැනුම සංවිධානය කිරීමේ දී මෙන්ම පාඨක සේවා සැපයීමේ දී ජාතික ග්‍රන්ථ නාමාවලියකින් මහඟු දායකත්වයක් ලබාගත හැකිය.

රටක ජාතික ග්‍රන්ථ නාමාවලියට (ප්‍රවර්තන) ප්‍රමුඛස්ථානය ලැබෙන අතර ම, පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලියට ද ඒ හා සමාන ස්ථානයක් හිමි වෙයි. ඕනෑම රටක අතීත බුද්ධිය වර්තමාන පර්යේෂණ සඳහා යොදා ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලී උපකාරී වේ. ඕනෑම රටක අතීතයේ සිට ආරක්ෂා කරගනු ලැබූ ග්‍රන්ථ නාමාවලී හා සූචි සෘජුවම සම්බන්ධ කර ගෙන හෝ පැරණි පුස්තකාල හා ලේඛනාගාරවල තැන්පත් කර ඇති පොත්පත් භෞතිකව පරීක්ෂා කොට ඒවායේ අඩංගු ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇසුරින් වර්තමානයේ ග්‍රන්ථ නාමාවලී සම්පාදනය කිරීම පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලීකරණය ලෙස හැඳින්වේ. එල්. එම්. හැරල්ඩ්ගේ පුස්තකාලයාධිපතීන්ගේ පාරිභාෂිත ශබ්ද මාලාවට අනුව පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලියක් යනු කලින් වර්ෂවල ප්‍රකාශයට පත්කරන ලද පොත් ඇතුළත් වන ග්‍රන්ථ නාමාවලියකි. ඉහත දැක්වූ අර්ථ නිරූපණවලට අනුව කිසියම් මඟහැරුණු කාල වකවානුවක් හෝ සිතාමතා අතහැර දැමූ කාල පරිච්ඡේදයක් තුළ රටක පළ වූ පොත්පත් ඇතුළත් කොට සම්පාදනය කරනු ලබන ග්‍රන්ථ නාමාවලිය පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලිය ලෙස හැඳින් වේ. මේ අනුව බලන කල රටක ජාතික ග්‍රන්ථ නාමාවලිය (ප්‍රවර්තන) මෙන්ම පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය ජාතික තොරතුරු සැපයීමේ කාර්යය සඳහා මහත් සේ උපකාරී වේ.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය දෙස බැලීමේ දී සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවන කෘතිවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඊට ඇතුළත් වෙයි. මාසිකව පළවන ජාතික ග්‍රන්ථ නාමාවලිය ඊළඟ මාසයේ අවසානයට පෙර ප්‍රකාශනයට පත් කිරීම ජාතික පුස්තකාලයේ ග්‍රන්ථ නාමාවලී අංශය සතු වගකීමකි.

පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලී ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය ඇරඹි 1963 සිට අද දක්වා වූ ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් වූ හා පත්වෙමින් පවතින කෘතීන් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ලබා ගැනීමට පාඨකයාට හැකියාව ලැබෙයි. නමුත් ලංකාවේ මුද්‍රණ කර්මාන්තය 1737 දක්වා ඈත අතීතයට දිව යන්නකි. එබැවින් 1737 - 1962 දක්වා කාල පරාසය ආවරණය වන පරිදි පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලී සම්පාදනයේ අවශ්‍යතාවය මතු විය. ලංකාවේ මුල්ම පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලිය ලෙස හඳුන්වා දිය හැක්කේ 1970 දී එච්. ඒ. අයි. ගුණතිලක මහතා විසින් සම්පාදිත "A bibliography of Ceylon" නමැති ග්‍රන්ථ නාමාවලියයි. මෙහි 1507 - 1967 දක්වා තොරතුරු ඇතුළත් කර ඇත. මෙහි සෑම සංලේඛයකම ප්‍රකාශනය පිළිබඳව කෙටි විස්තරයක් ඇතුළත්ව ඇත. මෙය සාමාන්‍ය ග්‍රන්ථ නාමාවලියකට වඩා වෙනස් වුවද සියවස් හතර හමාරක් තුළ ලංකාව පිළිබඳ විදේශීය බසින් ලියවී ඇති කෘතීන් සැලකිය යුතු ප්‍රමාණයක් ආවරණය වී ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ස්ථාපිත වීමත් සමඟ 1990 අප්‍රේල් මාසයේ දී විශාල ව්‍යාපෘතියක් වශයෙන් 1737 -1962 කාල පරාසය ආවරණය කිරීම ආරම්භ විය. එහි මුල් පියවර වශයෙන් 1962 පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලිය 1993 වසරේ දී පමණ ප්‍රකාශයට පත්විය.

ජාතික ග්‍රන්ථ නාමාවලී හැරුණු කොට විශේෂිත විෂය යටතේ ප්‍රකාශයට පත් කරන ලද කෘති පිළිබඳ විස්තර ඇතුළත් ග්‍රන්ථ නාමාවලී විෂය ග්‍රන්ථ නාමාවලී යටතට ගැනෙන අතර මෙහි දී විෂයීය වශයෙන් කෘති වෙන් වෙන් වශයෙන් වර්ග කොට දක්වා තිබීම සුවිශේෂත්වයකි. ළමා ග්‍රන්ථ නාමාවලී යනු ළමා කෘති පිළිබඳව විස්තර අන්තර්ගත කොට ප්‍රකාශයට පත්කර ඇති නාමාවලි ය. නමින්ම ගම්‍ය වන පරිදි මෙහි ඇතුළත් වන්නේ ළමා කෘති පිළිබඳව විස්තර පමණි. එපමණක් ද නොව කර්තෘ යටතේ ද, ප්‍රකාශක යටතේ ද ආදී ලෙසින් විවධාකාරයෙන් ග්‍රන්ථ නාමාවලී

සම්පාදනය කිරීමට හැකි ය. මේ අනුව ගත් කළ විමර්ශන මූලාශ්‍රය අතර ග්‍රන්ථ නාමාවලී සඳහා සුවිශේෂී ස්ථානයක් හිමි වන බව පැහැදිලි ය.

**2. ශබ්දකෝෂ (Dictionaries)**

ශබ්දකෝෂයක් යනු විශේෂිත වූ භාෂාවක හෝ භාෂා දෙකක් හෝ කිහිපයක් තුළ ඇති වචන පිළිබඳ විස්තර ඇතුළත් තොරතුරු එකතුවකට ය. බොහෝ විට මේවා මුද්‍රිත ස්වරූපයෙන් හෝ විද්‍යුත් ස්වරූපයෙන් හෝ එකී දෙයාකාරයෙන් ම ද දැකිය හැකි ය.

එසේ එක් භාෂාවකට පමණක් සීමා වූ එනම්, ඒක භාෂික ශබ්දකෝෂයක් නම්, එකී වචනවල නිරුක්තිය, පර්යාය වචන මෙන්ම ශබ්දාර්ථ ද ගවේෂණය කරගත හැකි වන පරිදි සකසා තිබේ.

- Oxford English Dictionary
- ශ්‍රී සුමංගල සිංහල ශබ්දකෝෂය

වැනි ශබ්දකෝෂ ඒක භාෂික ශබ්දකෝෂ ගණයෙහි ලා ගිනිය හැකි ය. ද්වි භාෂික ශබ්දකෝෂ හෝ බහු භාෂික ශබ්දකෝෂයක් නම්, එකී වචනයන්ගේ ශබ්දෝච්චාරණය, නිරුක්තිය හෙවත් පදයන්ගේ ආරම්භය හා එහි භාවිතය පිළිබඳව තොරතුරු ඇතුළත් කරමින් ශබ්දකෝෂයක් සම්පාදනය කරනු ලැබේ. එවැනි ශබ්දකෝෂ අතර,

- මලලසේකර ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂය
- අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය
- සිංහල ඉංග්‍රීසි දෙමළ මහා ශබ්දකෝෂය
- සුචරිත ගම්ලත් විසින් සම්පාදිත සිංහල ඉංග්‍රීසි මහා ශබ්දකෝෂය

යනාදිය ප්‍රමුඛස්ථානයක් ගනී.

ශබ්දකෝෂ සෑම විට ම භාෂාවක ආකාරාදී අනුපිළිවෙල යටතේ ඉදිරිපත් කරනු ලබයි. භාෂාමය වශයෙන් නිර්මාණය වී ඇති ශබ්දකෝෂ හැරුණු විට විවිධ විෂයයන් යටතේ ඇති පාරිභාෂික වචන ඇතුළත් කරමින් ද ශබ්දකෝෂ බිහි වී තිබෙනු දැකිය හැකි ය. ඒ අනුව යම් විෂයකට ආවේණික ඊට අදාළ වචන අළලා සකස් කරනු ලබන මෙවැනි ශබ්දකෝෂ මඟින් එකී විෂයෙහි වචන පිළිබඳ පමණක් විමර්ශනය කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසයි. එවැනි ශබ්දකෝෂ අතර,

- පුස්තකාල හා විඥාපන විද්‍යා ශබ්දකෝෂය
- පරිගණක විද්‍යා ශබ්දකෝෂය
- බෞද්ධ ශබ්දකෝෂය

වැනි ශබ්දකෝෂ පෙන්වා දිය හැකි ය.

මුලින් සඳහන් කළ පරිදි ශබ්දකෝෂ වුකලී මුද්‍රිත, විද්‍යුත් ස්වරූපයෙන් මෙන් ම මෙකී දෙයාකාරයෙන් ම වර්තමානය වන විට බිහි වී තිබෙනු දැකිය හැකි ය. මුද්‍රිත වශයෙන් බිහි වී ඇති ශබ්දකෝෂ පිළිබඳව කරුණු ඉහතින් දක්වන ලද අතර විද්‍යුත් ස්වරූපයෙන් ඇති ශබ්දකෝෂ ලෙසින්,

- මධුර මාර්ගගත ශබ්දකෝෂය (Madhura On-line Dictonary)
- දෙරණ සිංහල ඉංග්‍රීසි ශබ්දකෝෂය (Derana Sinhala - English Dictonary)
- මලලසේකර ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂය (දෘඪ තැටිය (CD))
- Oxford English Online Dictonary (Oxford English Dictonary CD)
- Free On-line Dictionary of Computing

යනාදිය පෙන්වා දිය හැකි ය. මේවා ශ්‍රව්‍යදෘශ්‍ය විමර්ශන මූලාශ්‍ර ලෙසින් ද හඳුන්වා දිය හැකි ය. විද්‍යුත් වශයෙන් පවත්නා ශබ්දකෝෂ ද මේ අනුව දෙයාකාරයකින් දැකිය හැකි වන අතර ඒවා

- මාර්ගගත (On-line)

- මාර්ගගත නොවන (Off-line)

ආදී ලෙසින් පෙන්වා දිය හැකි ය. මාර්ගගත ශබ්දකෝෂ අන්තර්ජාලය හරහා ගවේෂණය කර භාවිත කළ හැකි අතර මාර්ගගත නොවන ශබ්දකෝෂ දෘඪ තැටියක ආකාරයෙන් හෝ පරිගණක මෘදුකාංගයක් ලෙසින් පවතින අතර පරිගණක මෘදුකාංගයක් ලෙසින් දක්නට ඇති ශබ්දකෝෂ පරිගණකයට ස්ථාපිත කිරීමෙන් අනතුරුව භාවිතයට ගත හැකි ය.

3. **විශ්වකෝෂ (Encyclopedias)**

විශ්වයේ පවතින සමස්ත ඥානය එනම්, විශ්ව ඥානය විශේෂිත අනුක්‍රමයකට අනුව පෙළ ගස්වා ඇති මූලාශ්‍ර විශේෂයක් ලෙස විශ්වකෝෂ හැඳින් විය හැකි ය. වචනයෙහි පරිසමාප්තාර්ථයෙන් ම විශ්වකෝෂ වූකලී විශ්විය දැනුම එකට එකතු කොට කෝෂයක් ලෙස සම්පාදය කර ඇති කෘති විශේෂයකි. විශ්ව ඥානය අතැඹුලක් සේ ගෙන ඇති විශ්වකෝෂ නිතැතින් ම විමර්ශන මූලාශ්‍රයක් බවට පත්ව තිබීම පුදුමයට කරුණක් ද නොවේ. එල්. ජී. හැරල්ඩ් (L.G. Harrod) සඳහන් කරන ආකාරයට

> "ලොව ප්‍රකාශිත සෑම දැනුම් පරාසයක් පිළිබඳව හෝ තෝරාගත් එක් විෂයයක් පිළිබඳව හෝ ප්‍රකාශයට පත් වී ඇති සියලු තොරතුරු කිසියම් අනුපිළිවෙළකට අනුව සකස් කරමින් ඉදිරිපත් කර ඇති විමර්ශන මූලාශ්‍රය විශ්වකෝෂ නම් වේ."

ශබ්දකෝෂයක් මෙන් අර්ථ නිරූපණයෙන් පමණක් නොනවත්නා විශ්වකෝෂය එහි ශීර්ෂ වශයෙන් එන සෑම කරුණක් පිළිබඳව ම සියලු විස්තර විභාග දක්වන්නා වූ ද, විවිධ පාඨකයන්ගේ නානා තොරතුරු අවශ්‍යතාවයන් පිරිමසා ගන්නා වූ ද, කෘතියකි. විශ්වකෝෂය වනාහි එක් දෙයකට පමණක් සීමා වූ ග්‍රන්ථ විශේෂයක් නොවේ. විශ්වකෝෂයක් බොහෝ විට වෙළුම් කිහිපයකින් සමන්විත වන අතර මේවා සකස් කරනු ලබන්නේ එක් එක් විෂය ක්ෂේත්‍රයන්ට සම්බන්ධ විෂය විශේෂඥයින් විසිනි. විශ්වකෝෂයක් යයි ගත් කල්හි එහි ඇත්තේ එකම කරුණක් පිළිබඳව නොවේ. එය බොහෝ විට විෂය ගණනාවකින් සමන්විත වන්නකි. මෙනිසා එක් එක් විෂයට සම්බන්ධ විෂය විශේෂඥයින් ගණනාවක් මීට සම්බන්ධ වන හෙයින් විශ්වකෝෂ බොහෝ විට බහු කර්තෘත්වයකින් සමන්විත වන බවක් පෙනෙන්නට ඇත.

1. පොදු විශ්වකෝෂ
2. විෂය විශ්වකෝෂ

ලෙස ප්‍රධාන වශයෙන් විශ්වකෝෂ කොටස් දෙකකින් යුක්තව බෙහෝ විට දැක ගත හැකි ය.

පොදු විශ්වකෝෂවල ලොව ප්‍රකාශයට පත් වී ඇති සෑම ක්ෂේත්‍රයකට ම අදාළ තොරතුරු අන්තර්ගත වී ඇති අතර ඒවා බහු විමර්ශන කෘති ගණයට අයත් වේ. මීට උදාහරණ ලෙස,

- Encyclopedia of Britannica
- Encyclopedia of Americana
- Encyclopedia of Encarta

වැනි විශ්වකෝෂ සඳහන් කළ හැකි ය.

කිසියම් විෂය ක්ෂේත්‍රයකට පමණක් සීමා වී ඇති විශ්වකෝෂ වර්ගය විෂය විශ්වකෝෂ ලෙස පෙන්වා දිය හැකි ය. විෂය යයි කී කල්හි බොහෝ දුරට කිසියම් භාෂාවක් ආවරණය කරනු ලබන විශ්වකෝෂ ද මීට ම ඇතුළත් කළ හැකි ය. මේවා ද බහු කර්තෘත්වයකින් යුක්ත ය. මෙයට උදාහරණ ලෙස,

- Encyclopedia of Library and Information Science
- Encyclopedia of Religion and Ethics
- Encyclopedia of Social Cultural Anthropology
- Sinhalese Encyclopedia

යනාදිය පෙන්වා දිය හැකි ය. විශ්වකෝෂයක් නිර්මාණය කිරීම යනු ඉතාමත් භාරධූරකාර්යයකි. ලොව පුරා සියලු දෑ ආවරණය කිරීමට සිදු වන නිසා නැතහොත් භාෂාවක් නම් භාෂාවෙහි සියලු දෑ පිළිබඳව අකාරාදීව කරුණු ඉදිරිපත් කිරීමට සිදු වන හෙයින් මෙය වෙළුම් ගණනාවකින් බොහෝ විට සමන්විත වෙයි. එමෙන් ම බහු කර්තෘත්වයකින් ද සමන්විත ය.

විශ්වකෝෂවල කාලීන බව ආරක්ෂා කිරීමට විශ්වකෝෂවලට සමගාමීව අතිරේක උපකාරක ග්‍රන්ථ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරයි. මේවා "Supplement" යනුවෙන් හඳුන්වනු ලබන අතර බොහෝ දුරට විශ්වකෝෂයෙහි යාවත්කාලීන බව ආරක්ෂා කිරීමට හේතුවක් වෙයි.

## 4. වාර්ෂික ග්‍රන්ථ (Yearbooks)

ලෝකයේ රටවල් පුරා දේශපාලනික, ආගමික, සංස්කෘතික, ආර්ථිකමය, සමාජීය වශයෙන් සිදු වූ වැදගත් සිදුවීම් අළලා වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශන වාර්ෂික ග්‍රන්ථ ලෙස හැඳින් වේ. සරලව ගතහොත් විවිධ වූ රාජ්‍ය මෙන් ම පෞද්ගලික ආයතන ආදියෙහි පසුගිය වර්ෂයට අදාළව සිදු කරන ලද වැඩ පිළිබඳ වාර්තා ආදී විස්තර අන්තර්ගත කොට ආයතනික වශයෙන් එහි උඩෘතයන් විස්තර කර හුවා දක්වමින් සංගෘහිත වාර්ෂික ප්‍රකාශනය වාර්ෂික ග්‍රන්ථ ලෙස හැඳින් වේ. මේවා වර්ෂයකට වරක් ප්‍රකාශ කරනු ලබන අතර එහෙයින් ම වාර්ෂික ග්‍රන්ථයන් ලෙසින් හඳුන්වනු ලැබේ.

වාර්ෂික ග්‍රන්ථ විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් ඉතා වැදගත් වන අතර ම මූලාශ්‍ර විමර්ශනයේ දී අත්‍යවශ්‍ය මූලාශ්‍රය වර්ගයක් ලෙසින් පෙන්වා දීමට හැකි ය. වාර්ෂික ග්‍රන්ථයන් කොටස් තුන යටතේ දක්විය හැකි ය.

1. පොදු වාර්ෂික ග්‍රන්ථ
2. විෂය වාර්ෂික ග්‍රන්ථ
3. විශ්වකෝෂ අතිරේක

වශයෙනි. පොදුවේ සෑම ක්ෂේත්‍රයක් ම අළලා සම්පාදනය වන්නා වූ වාර්ෂික ග්‍රන්ථ පොදු ග්‍රන්ථ වන අතර යම් විෂයන් විශේෂ කොට සම්පාදනය වන්නා වූ වාර්ෂික ග්‍රන්ථ විෂය වාර් ග්‍රන්ථ ලෙසින් හැඳින් වේ. විශ්වකෝෂයක් මුද්‍රණය වී නැවත එහි සංස්කරණයක් එළි දැක්වීම අතරතුර කාලයේ ලොව පුරා සිදු කළ, සිදු වූ වැදගත් සිදුවීම් හා විවිධ මාතෘකා ඔස්සේ යාවත්කාලීන වූ තොරතුරු ඇතුළත් කරමින් සංගෘහිත කෘති විශ්වකෝෂ අතිරේක ලෙස හැඳින් වේ.

## 5. නියමාවලී (Manuals)

පරිගණක හෝ වෙනයම් ස්වයංක්‍රීය මට්ටමකින් මුක්තව මිනිසා විසින් ශාරීරිකව (අතින්) පාලනය කරනු ලබන යමකට එය ක්‍රියා කරවන්නේ කෙසේ ද ආදියෙහි පටන් ඒ හා සම්බන්ධිත විස්තර ඇතුළත් කොට බහුවිධ උපදෙස් මාලාවකින් සංගෘහිත කුඩා කෘතියක් නියමාවලියක් ලෙසින් අර්ථ නිරූපණය කළ හැකි ය. නාමිකව ම හැඟවෙන පරිදි මේවාහි යම් යම් නියමයන් අන්තර්ගත කොට ඇත. ඒ අනුව එකී නිගමන තුළ යම් උපකරණයක් නම්, එය ක්‍රියාත්මක කළ යුතු ආකාරය, දෝෂයක් නිරවුල් කර ගන්නේ කෙසේ ද, ඒ ඒ අවස්ථාවන්හි දී සිදු කළ යුතු ක්‍රියාවන් කවරේ ද යනාදිය විස්තර කරනු ලබයි. ගූගල් වෙබ් නිර්වචනයට අනුව එය "A book giving instructions or information" ලෙසින් දක්වා තිබේ.

## 6. චරිතාපදානාත්මක මූලාශ්‍ර (Biographical Resources)

යම් පුද්ගලයෙකුගේ ජීවන තොරතුරු, ඔවුන් විසින් ස්වකීය ක්ෂේත්‍රයට ඉටු කළ මෙහෙවර, ලැබූ ත්‍යාග හා නම්බු නාම පිළිබඳව සවිස්තරාත්මකව ඇතුළත් කරමින් ඉදිරිපත් කරනු ලබන මූලාශ්‍රය චරිතාපදානාත්මක මූලාශ්‍ර ලෙසින් හැඳින් වේ. හුදෙක් මේවා පුද්ගල චරිත පදනම්ව ගොඩ නැඟී ඇති හෙයින් චරිතාපදාන ලෙසින් දක්වා ඇත. චරිතාපදාන ගත් කල්හි දෙයාකාරයකින් යුක්තව බව පෙනේ.

- ස්වයං ලිඛිත
- අන්‍ය ලිඛිත

ඒ අනුව ස්වයං ලිඛිත චරිතාපදාන යනුවෙන් හැඳින් වෙන්නේ යම් පුද්ගලයෙකු ඔහු විසින් ම ස්ව චරිතය පිළිබඳව කරනු ලබන අපදාන යයි. අන්‍ය ලිඛිත චරිතාපදාන යනුවෙන් අදහස් කරනු ලබන්නේ කිසියම් පුද්ගල චරිතයක් අළලා වෙනත් පුද්ගලයෙකු විසින් සංගෘහිත කෘතියකට ය. ථේරාපදාන හා ථේරී අපදාන ලෙසින් බෞද්ධ සාහිත්‍යය තුළ පවා චරිතාපදානාත්මක මූලාශ්‍ර දැකිය හැකි වේ. බුද්ධකාලීන භික්ෂු භික්ෂුණීන්ගේ චරිත මෙමගින් නිරූපණය කෙරේ. චරිතාපදානාත්මක මූලාශ්‍ර සඳහා ඉතා ප්‍රකට උදාහරණ කෘති ලෙසින්

- Who's Who
- Who was Who
- Curent Bibliography

වැනි ග්‍රන්ථ පෙන්වා දිය හැකි ය.

**7. අනුක්‍රමණිකා (Indexes)**

විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් අනුක්‍රමණිකා ඉතා වැදගත් ස්ථානයක් හිමි කරගනු ලබන්නේ යමක් විමර්ශනය කිරීමේ දී එහි ඇති වැදගත්කම මිනිය නොහැකි හෙයිනි. අකාරාදී අනුක්‍රමය යටතේ පෙළ ගස්වා ඇති පුද්ගල, ස්ථාන, විෂයය ආදියෙහි විධිමත් ලැයිස්තු අනුක්‍රමණිකා යනුවෙන් හඳුන්වනු ලැබේ.

පුස්තකාල විද්‍යාවේදී අනුක්‍රමණිකා යනුවෙන් අදහස් කරනු ලබන්නේ ග්‍රන්ථ නාම, කර්තෘ නාම සූචිපත්‍ර ආදියෙහි සංස්ථානික නැතහොත් ක්‍රමානුකූල ලැයිස්තුවකට ය. ඒ අනුව යම් පුද්ගලයන් හෝ යම් දෙයක් පිළිබඳ විමර්ශනය කිරීමේ දී අනුක්‍රමණිකා ඉතා වැදගත් ස්ථානයක් හිමිකරගනු ලබයි. විමර්ශන සේවාවේ දී අනුක්‍රමණිකා අත්‍යවශ්‍ය විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් පෙන්වා දීමට පිළිවන.

**8. මාලික ප්‍රකාශන (Serial Publications)**

වාර සාහිත්‍යය නැතහොත් වාර ප්‍රකාශන යනුවෙන් මෙම විමර්ශන මූලාශ්‍රය හඳුන්වනු ලැබේ. පොදුවේ ගත් කල්හි මෙම ප්‍රකාශන සඟරා ලෙස නම් කරන අතර මේවා යම් නිශ්චිත කාල පරාසයක් තුළ යම් යම් සම්මතයන් තුළ පිහිටා ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙසේ ප්‍රකාශයට පත්වන එමෙන් ම ඉතා ප්‍රකට වාර ප්‍රකාශන වර්ගයක් ලෙසින් පුවත්පත් හඳුන්වා දිය හැකි ය. මේවා දිනපතා, සතිපතා හෝ සම්මත කරගත් කාල පරාසයන් තුළ මුද්‍රණය කරනු ලබයි. මාසික, ද්වි මාසික, ත්‍රෛමාසික, සිවු මාසික ආදී වශයෙන් මෙන් ම අර්ධ වාර්ෂික ලෙසින් ද ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙසේ ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන අතර පුවත් හසුන් (News Letters), ශාස්ත්‍රීය ලිපි සරණි (Literary Magazines) හා අධ්‍යාපනික සඟරා ආදිය ද වේ. එපමණක් ද නොව වාර්ෂික පළවන වාර්ෂික වාර්තා (Yearbooks) ද වාර සඟරා ගණයට අයත් වේ.

වාර සඟරා කලාප හෝ කාණ්ඩ (Volume) වශයෙන් ආරම්භයේ සිට කිනම් ප්‍රකාශනය ද යන්නත්, කුමන මුද්‍රණය (Issue) ද යන්නෙන් එකී වර්ෂයෙහි කී වැනි මුද්‍රණය ද යන්නත් සඳහන් කරනු ලබයි. ඒ අනුව ආරම්භයේ සිට අදාළ සඟරාව කොපමණ වාර ගණනක් ප්‍රකාශයට පත් කර ඇති ද යන්න පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් ලෙසින් ද මෙය පෙන්වා දිය හැකි ය.නිදසුනක් ලෙසින් 2005 වර්ෂයේ ආරම්භ කරන ලදුව මාසිකව අඛණ්ඩව ප්‍රකාශයට පත්කර ගෙනවිත් 2014 වර්ෂයේ අප්‍රේල් මාසයේ එය ප්‍රකාශයට පත් කරන්නේ නම් ද, එහි කාණ්ඩය (Volume) වන්නේ 10 යි. ඒ අනුව කාණ්ඩය යන්නෙන් ආරම්භයේ සිට කොපමණ වර්ෂයක් ගත වී ඇද්ද යන්න පිළිබඳව සඳහන් වේ. එමෙන් ම මුද්‍රණය (Issue) යන්නෙන් අදාළ වර්ෂයේ කුමන වාරය ද යන්නත් සඳහන් වේ. ඒ අනුව මාසික සඟරාවක් වන මෙම සඟරාවෙහි මුද්‍රණය (Issue) වන්නේ 4 වැනි මුද්‍රණය යි.

වාර සඟරා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කොට දැක්විය හැකි ය. එනම්,

- සාමාන්‍ය වාර සඟරා (Popular)
- විද්වත් වාර සඟරා (Scholarly)

ලෙසිනි. සාමාන්‍ය වාර ප්‍රකාශන යටතේ දිනපතා හා සතිපතා පළවන ලංකාදීප, දිනමිණ, Times, Daily News ආදී පුවත්පත් ද, විද්වත් වාර ප්‍රකාශන යටතේ වෛද්‍යවරයා, සමාජ විමර්ශී, The Journal of Psychology, Journal of Social Work වැනි සඟරා ද පෙන්වා දිය හැකි ය.

**9. අත්පොත් (Handbooks)**

අත්පොත් යනු විමර්ශන කෘති වර්ගයක් වන අතර ඉතා වැදගත් විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් හැඳින්විය හැකි ය. අත්පොත් බොහෝ විට උපදෙස් නැතහොත් යමක් සිදු කළ යුතු පිළිවෙළ අඩංගු කොට සම්පාදනය කරනු ලැබේ.

අත්පොත් වනාහි ඕනෑම මාතෘකාවක් අළලා සම්පාදනය විය හැකි ය. යම් විශේෂිත වූ විෂයක හෝ වෙනයම් කුමක හෝ තොරතුරු ඇතුළත් සාර සංග්‍රහයක් හෝ විශේෂිත ක්‍රම ශිල්පයන්ගේ එකතුවක් ලෙසින් ද අත්පොත් හඳුන්වා දිය හැකි ය. අත්පොත් බොහෝ සෙයින් නිර්මාණය කරනු ලබන්නේ එහි අඩංගු තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිද්දෙන් මෙන් ම පැන නගින පැනයකට පහසුවෙන් පිළිතුරක් ලබාගත හැකි වන පරිද්දෙනි. අත්පොත් යන්නට තුල්‍යාර්ථයක් ලෙසින් කාර්යය සංග්‍රහ නැතහොත් නියමාවලී (Manuals) යන්න ද භාවිත කළ හැකි ය. අත්පොතක් බොහෝ සෙයින් යම් විෂයක හෝ වෙනයම් පරාසයක පූර්ව නිර්මිත යොමුවක් ලෙසින් ද පෙන්වා දිය හැකි ය. විශේෂයෙන් අත්පොත් විශාල වශයෙන් භාවිත වන්නේ විද්‍යා විෂයයන්, වෛද්‍ය විද්‍යාව වැනි විෂයයන් ආශ්‍රිතව ඒවාහි විවිධ තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා ය.

**10. නාමාවලී (Directories)**

ස්වාධීන හෝ ආයතනික වශයෙන්, අකාරාදී හෝ කිසියම් අනුක්‍රමයක් යටතේ යම් විෂයක හෝ තේමාවක් යටතේ නිර්මාණය වන්නා වූ ප්‍රකාශන නාමාවලී ලෙසින් හැඳින් වේ. නාමාවලී තුළ බොහෝ සෙයින් අදාළපරිදි නම්, ලිපිනයන් හා දුරකථන අංක පිළිබඳව විස්තර ඇතුළත් කරමින් විමර්ශනාත්මක වශයෙන් තොරතුරු අන්තර්ගත කොට තිබේ.

නාමාවලී, ව්‍යාපාර නාමාවලී, දුරකථන නාමාවලී, වෙබ් අඩවි නාමාවලී, ආදී වශයෙන් විවිධ ස්වරූප උසුලයි.

**11. භූගෝල විද්‍යාත්මක මූලාශ්‍රය (Geographical Recourses)**

පෘථිවි තලයෙහි ඇති සියලු ම සංරචක පිළිබඳ විස්තර ඇතුළත් කෘති භූගෝල විද්‍යාත්මක මූලාශ්‍ර යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම මූලාශ්‍රයන් බොහෝ විට කොටස් දෙකකින් යුක්තව දැකිය හැකි ය.

- ස්වාභාවික භූගෝල විද්‍යාත්මක මූලාශ්‍රය
- නිර්මිත (කෘත්‍රිම) භූගෝල විද්‍යාත්මක මූලාශ්‍රය

යනුවෙනි. ස්වාභාවික භූගෝල විද්‍යාත්මක මූලාශ්‍රය යනුවෙන් අදහස් කරනු ලබන්නේ සීමාවක් සම්මත කළ නොහැකි භූමියෙහි දක්නට ඇති භූ රූප, විවිධ පරිසර පද්ධති යනාදියයි. නිදසුනක් ලෙස බිම් ප්‍රදේශයන්ගේ විවිධ ස්වරූපයන්, සමුද්‍රය, විල්, ජලාශ ආදී ලෙස ජලය පවතින විවිධ ස්වභාවයන්, ගස්වැල්, සතුන් ඇතුළු පරිසරය ඇසුරු කරමින් පවතින ස්වාභාවික පාරිසරික පද්ධති යනාදිය පෙන්වා දිය හැකි ය. ඒ අනුව මෙකී තොරතුරු ඇතුළත් කරමින් නිර්මාණය කරනු ලබන ප්‍රකාශන මේ කොටසට අයත් වේ.

නිර්මිත භූගෝල විද්‍යාත්මක මූලාශ්‍ර යනුවෙන් හඳුන්වනු ලබන්නේ මිනිසා විසින් කෘත්‍රිමව නිර්මාණය කරන ලද භූමිය ආශ්‍රය කරගත් මූලාශ්‍රයන් ය. ඒ අනුව මිනිසා විසින් සිදු කරනු ලබන සියලුම ගොඩනැගීම් මේ යටතේ ගිණිය හැකි ය. නිදසුන් ලෙසින් මිනිසා විසින් ගොඩනගන ලද

අධිවේගී මාර්ග පද්ධති, ගුවන් තොටුපලවල්, පාලම්, ඇළ මාර්ග, දුම්රිය මාර්ග, විවිධ ගොඩනැගිලි ආදිය පිළිබඳ තොරතුරු ඇතුළත් කෘති පෙන්වා දිය හැකි ය. මෙපමණක් ද නොව සිතියම් විද්‍යාත්මක භූගෝලීය මූලාශ්‍ර යනුවෙන් හඳුන්වා දිය හැකි මූලාශ්‍ර කොටසක් ද දැකිය හැකි ය. මේවා මිනිසා විසින් ඔවුන්ගේ විවිධ ක්‍රියාකාරම් පහසුවෙන් සිදු කර ගැනීම සඳහා මවා ගන්නා ලද මූලාශ්‍රයන් ලෙසින් හැඳින්වීමට හැකි ය. බොහෝ විට මේවා ස්වාභාවික භූ තලයෙහි දැකිය නොහැකි වන අතර සිතියම් වැනි ඒවාහි දක්නට ලැබේ. යාත්‍රණයට අවශ්‍ය තොරතුරු, විවිධ මිනුම් කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම උදෙසා මේවා ගොඩ නගා ගෙන තිබෙනු දැකිය හැකි ය. නිදසුනක් ලෙස සමක රේඛාව පෙන්වා දිය හැකිය. මෙය හුදෙක් ම ස්වභාවික පෘථිවි තලයෙහි නොදැකිය හැකි වුවත් සිතියම් වැනි ඒවාහි දක්නට තිබේ.

මේ අනුව භූගෝල විද්‍යාත්මක මූලාශ්‍ර

1. ප්‍රාදේශීය නාමාවලී (Gassetteers)
2. මාර්ගෝපදේශ ග්‍රන්ථ (Guide Books)
3. සිතියම් (Atlas)

ලෙස කොටස් තුනක් යටතේ හඳුනාගත හැකි ය. ප්‍රාදේශීය වශයෙන් කිසියම් අනුක්‍රමයකට සංවිධානය කර ඇති තොරතුරු ඇතුළත් භූගෝල විද්‍යාත්මක මූලාශ්‍ර ප්‍රාදේශීය නාමාවලී නම් වේ. ලොව විවිධ ස්ථානයන්හි සංචාරය කරන්නවුන්ගේ පහසුව පිණිස ඔවුනට මාර්ගෝපදේශ සැපයීම උදෙසා නිර්මාණය කර ඇති ග්‍රන්ථ මාර්ගෝපදේශ ග්‍රන්ථ නම් වන අතර විවිධ භූ විද්‍යාත්මක සිතියම් ආදිය සිතියම් මූලාශ්‍ර ගණයෙහි ලා සළකනු ලැබේ.

**12. රජයේ ප්‍රකාශන (Government Publications)**

රටක රජයක් විසින් යම් යම් සිදුවීම් අළලා ප්‍රකාශයට පත් කරන්නා වූ ප්‍රකාශන රජයේ ප්‍රකාශන ලෙසින් හැඳින් වේ. විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් මේවා ඉතා වැදගත්කමක් උසුලනු ලබන්නේ එකී තොරතුරු වෙනයම් මාර්ග ඔස්සේ එළිදැක්වීමක් සිදු නොවන හෙයිනි. රටක ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණ කටයුතු පිළිබඳව තීරණ රජයේ ප්‍රකාශන තුළ ගැබ්ව තිබේ.

රජයේ ප්‍රකාශන ගත් කල්හි රාජ්‍ය ආයතනික මට්ටමින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශනයන් ද මීට ඇතුළත් කළ හැකි ය. ඒ අතර

- රජයේ ගැසට් පත්‍රය
- රජයේ විවිධ චක්‍රලේඛ

ආදිය ප්‍රධාන වශයෙන් පෙන්වා දිය හැකි ය. එමෙන් ම විවිධ නීති රීති ඇතුළත් ප්‍රකාශන, විවිධ අණ පනත් ආදිය ද මීට අන්තර්ගත ය. මෙකී ප්‍රකාශන අධ්‍යයනය තුළින් පෙනී යන කරුණක් වන්නේ රජයේ ප්‍රකාශන විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් කෙතරම් වැදගත් ස්ථානයක් උසුලන්නේ ද යන්නයි.

**සමාලෝචනය**

මෙතෙයින් සලකා බලන කල්හි විමර්ශන මූලාශ්‍ර තොරතුරු සමුද්ධරණයේ දී කෙතරම් වැදගත් වන්නේ ද යන්න මනාව හඳුනා ගත හැකි ය. පුස්තකාලයෙහි හදවත නම් විමර්ශන අංශයයි. ඒ අනුව පුස්තකාල සේවාවේ කේන්ද්‍රස්ථානය විමර්ශන සේවය යන්න පැහැදිලි වේ. විමර්ශන අංශයක් තුළ විමර්ශිත කෘතීන්හි වටිනාකම අතිමහත් ය.

**ආශ්‍රේය**

1. ගුණසේකර, ධනපාල (1998), පුස්තකාල විද්‍යාවේ මූලිකාංග, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

2. Purcell, Gary R. (1984), Reference sources in library and information services, ass ass Publication, New Delhi.

3. Scott E. Kennedy, editor. (1999), Reference sources for small and medium-sized libraries, American Library Association, London.

4. Kent, Allen (1974), Encyclopaedia of library and information science, Vol. 25, Author, New York.

5. Ranganathan, S.R. (1961), Reference service, Ess Ess Publications, New Delhi.

6. Thomas, Diana M., Hinckley, Ann T. and Esenbach, Elizabeth R. (1981), The effective reference librarian, Academic press, New York.

7. William A. Katz (1982), Introduction to reference work: reference services and reference processes, McGraw-Hill, New York.

8. Sharma, C.K. (2006), Reference service and sources, Atlantic Publishers, New York.

9. wikipedia.org (2014), Referencesources [online], Available at: http://en.wikipedia. org/wiki/Reference_ Reference_ Sources, [accessed 05 August 2014]

10. library.tufts.edu (2014), Glossary of common library terms [online], Available at: http://www. librar.tufts.edu/tisch/about/glossary.htm, [accessed 05 August 2014]

11. dictionary.com (2014), Reference sources [online], Available at: www.dictionary.com, [accessed 05 August 2014]